# කාර්යසාධන වාර්තාව - 2019

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

# 2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම: **සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව**

වැය ශීර්ෂ අංකය **:243**

## අන්තර්ගතය


**පරිච්ඡේදය**

1. ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය
2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම
3. වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය
4. කාර්ය සාධන දර්ශක
5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය
6. මානව සම්පත් පැතිකඩ
7. අනුකූලතා වාර්තාව

## පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම :

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය හා ක්ෂුද්‍රමූල්‍ය අංශය නගා සිටුවීමේ අරමුණ පෙරදැරිකර ගනිමින් 2005 ජනවාරි මස 01 වන දින මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. විධායක නිලධාරීන් 18 දෙනෙකු ප්‍රමුඛ 46 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

#### 1.1.1 ප්‍රාථමික සංවර්ධන අංශය

රජයේ සංවර්ධන සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කිරීම, ප්‍රාථමික ආර්ථික සංවර්ධනය නංවාලීම, නැගී එන ආර්ථික කටයුතු සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීම යනාදී නියාමන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

#### 1.1.2 ක්ෂුද්‍රමූල්‍ය සංවර්ධන අංශය

දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ලොව පුරා පිළිගත් ක්‍රමවේදයක් වූ ක්ෂුද්‍රමූල්‍යනය පසුගිය දශක කිහිපය පුරා ලංකාව තුළ ද ක්‍රියාත්මක කර ඇත. ශ්‍රී ලංකාවේ පුළුල් භූගෝලීය ප්‍රදේශයක් පුරා ක්ෂුද්‍රමූල්‍ය සේවාවන් ව්‍යාප්තව පැවතුන ද ග්‍රාමීය ප්‍රදේශවල වාණිජ බැංකු හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු පෞද්ගලික අංශයේ ක්‍රියාකාරීත්වය අවම මට්ටමක පවතී. ක්ෂුද්‍රමූල්‍යනය, මධ්‍යම ආදායම්ලාභී කුටුම්භයන් හි ආදායම් හා වත්කම් වැඩි දියුණු කිරීමටත්, අඩු ආදායම්ලාභී කුටුම්භයන් හි පරිභෝජන වියදම් වැඩි කිරීමටත්, ඔවුන්ගේ ඉතිරි කිරීමේ පුරුද්ද වර්ධනය කිරීමටත්, සියළුම ආදායම් භාණ්ඩයන් හි පරිභෝජනය සුමට කිරීමේ මෙවලමක් ලෙසත්, කාන්තාවන්ගේ සාමාජීය හා ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීමටත් දායක වී ඇත.

#### 1.1.3 සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන අංශය

ශ්‍රී ලංකා රජයේ සමස්ත ප්‍රතිපත්ති රාමුව තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය වැදගත් උපායමාර්ගික අංශය ලෙස හඳුනාගෙන ඇත. එම අංශය මඟින් ආර්ථික වර්ධනය, ප්‍රාදේශීය සංවර්ධනය, රැකියා අවස්ථා උත්පාදනය හා දරිද්‍රතාවය තුරන් කිරීමට විශාල දායකත්වයක් ලබා දෙයි. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය මඟින් ලංකාවේ සමස්ත ව්‍යවසායන්ගෙන් සියයට 75 ක් ද, සේවා නියුක්තියෙන් සියයට 45 ක් ද, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 52 ක ට ද දායකත්වය සපයන බැවින් එය මනාව ලාංකික ආර්ථිකය තුළ පිළිඹිබු වේ.

#### 1.1.4 සංවර්ධන මූල්‍ය පිළිබඳ ක්‍රමෝපාය සැලසුම්

නිෂ්පාදකයින්ට තම වගා බිමේ දී ලබා දෙන මිල තහවුරු කරන අතරම ස්ථාවර වෙළඳපොල මිලක් ලබා දීම සඳහා අතිරික්ත අස්වනු කළමනාකරණය කර කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන් සහ අනෙකුත් වෙළඳපොල සාධකයන් කෙරෙහි අවධානය යොමු කරමින් සැපයුම් අංශය සහ ඉල්ලුම් පාර්ශවය තුලනය කිරීම.

ජාතික ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට වටිනා දායකත්වයක් ලබා දීමේ විභවයන් ඇති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරිමත් කිරීම හා නව ව්‍යවසායකයින් හඳුනා ගැනීම අරමුණු කරගෙන මෙම දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම යටතේ සහනදායී ණය, භාණ්ඩාගාර ඇපකර සහ තාක්ෂණික සහායන් සැපයීම ඇතුළු විවිධ රාජ්‍ය අනුග්‍රහයන් ලබා දීම සිදු කරනු ලබයි.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම :**

"සංවර්ධන මූල්‍ය සඳහා අවශ්‍ය පහසුකම් සපයන රජයේ ප්‍රමුඛ නියෝජිත ආයතනය බවට පත්වීම".

**මෙහෙවර :**

"අදාළ පාර්ශවයන්ගේ මැදිහත්වීම ඇතිව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් යෙදවීම හා ප්‍රාථමික ව්‍යවසාය අංශය මූල්‍යනය හා ඊට අදාළ ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම""

**අරමුණ :**

"සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය හා ක්ෂුද්‍රමූල්‍ය අංශය නඟා සිටුවීමේ අරමුණ පෙරදැරිකර ගනිමින් 2005 ජනවාරි මස 01 වන දින මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී".

## 1.3 ප්‍රධාන කාර්යයන්

- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන්හි සංවර්ධනය උදෙසා අවශ්‍ය ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් හා වැඩසටහන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

- වෙළඳපොල දත්ත විශ්ලේෂණය කර ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන්හි දියුණුවට බලපාන ප්‍රධාන ගැටළු හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය ඵලදායී විසඳුම් ලබා දීම.

- ආර්ථික සංවර්ධනය උදෙසා රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සහනාධාර වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ඊට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

- වෙළඳපොල අවශ්‍යතාවයන් අනුව, බැංකු, රක්ෂණය, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සහ මූල්‍ය අංශයන්ට අදාළ නීති බලගැන්වීම සඳහා අවශ්‍ය සහසුකම් සැලසීම.

- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය, බැංකු, මූල්‍ය වෙළඳපොල සහ අනෙකුත් අංශයන්ට අදාළව රජයේ වාර්ෂික අයවැය සැකසීමේ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැපයීම.


- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය, ප්‍රාථමික ව්‍යවසාය අංශය සහ අනෙකුත් අංශයන්ට අදාළ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සහ විදේශ ණය ආධාර මත ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පිළිබඳව කෘෂිකාර්මික, කාර්මික, හා සේවා යන අංශ යටතේ දත්ත රැස් කිරීම හා ඒවා විශ්ලේෂණය කිරීම මඟින් පවතින දුෂ්කරතා හා ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හඳුනා ගැනීම.

- රජයේ අනුග්‍රහය මත ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය සහන යෝජනා ක්‍රම පිළිබඳව සොයා බැලීම.

- රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන් හි සංවර්ධන ව්‍යාපෘති සඳහා දේශීය බැංකු හා මූල්‍ය පහසුකම් ලබා දීම.

### 1.4 සංවිධාන සටහන




| | |
|---|---|
| නි.අ. | - නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| ස.අ. | - සහකාර අධ්‍යක්ෂ |
| තො.ස. හා තා.නි. | - තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ නිලධාරි |
| ස.නි. | - සංවර්ධන නිලධාරි |
| තො.ස. හා තා.ස. | - තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර |
| ක.සේ.නි. | - කළමනාකරණ සේවා නිලධාරී |
| ක.ස. | - කළමනාකරණ සහකාර |
| රිය. | - රියදුරු |
| කා.කා.ස. | - කාර්යාල කාර්ය සහයක |

**1.5. ~~අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු~~/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/~~දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල.~~**

1. ප්‍රාථමික සංවර්ධන අංශය
2. ක්ෂුද්‍රමූල්‍ය සංවර්ධන අංශය
3. සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන අංශය
4. සංවර්ධන මූල්‍ය පිළිබඳ ක්‍රමෝපාය සැලසුම්
5. විශේෂ කාර්යයන්/ව්‍යාපෘත

**1.6 ~~අමාත්‍යාංශ~~/දෙපාර්තමේන්තුව/~~පළාත් සභාව යටතේ පවතින ආයතනය~~/අරමුදල්**

**1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)**

| **ව්‍යාපෘතියේ නම** | **දායක නියෝජිතායතනය** | **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම (රු. මිලියන)** | **ව්‍යාපෘති කාල සීමාව** |
|---|---|---|---|
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය | ආසියානු සංවර්ධන බැංකුව | 29,911 | 2016-2020 |
| වහලය මත සවිකරන ලද සූර්ය බලශක්ති උත්පාදන ණය යෝජනා ක්‍රමය | | 7,214 | 2019-2022 |

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

1. ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ (MSMEs) ව්‍යවසායන් නිෂ්පාදන ආර්ථිකයක් කරා ළඟා වීමේ දී ආර්ථිකයේ කොඳු නාරටිය ලෙස හඳුනාගෙන ඇත. එමෙන්ම සාර්ව ආර්ථික ඉලක්ක වෙත ළඟාවීම සඳහා එනම් දළ දේශීය නිෂ්පාදනය (GDP) වැඩි කිරීම, ඒක පුද්ගල අදායම වැඩි කිරීම මෙන්ම රැකියා වියුක්තිය අඩු කිරීම සහ ස්ථාවර ආර්ථිකයක් පවත්වාගෙන යාමට නම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පූර්ණ ධාරිතාවයෙන් යුක්තව ක්‍රියා කළ යුතු වේ. එසේ කිරීමට නම්, දිගුකාලීනව පවතින මූල්‍ය ස්ථායිතාවක් කරා ළඟාවීමේ බාධාවන් අවම කර වඩාත් හොඳ මූල්‍ය ප්‍රවේශයකට ව්‍යාපාරික පරිසරය සක්‍රීය කිරීම සඳහා සංවිධිත බංකු අංශය සාම්ප්‍රදායික බැංකු භාවිතයෙන්, සංවර්ධන බැංකු භාවිතයක් වෙත විතැන් විය යුතුය.

2. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා මූල්‍ය ප්‍රවේශය වඩාත් පහසුවෙන් ළඟා කර දීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් විශේෂ ණය යෝජනා ක්‍රම කිහිපයක් විදේශ ආධාර හරහා ක්‍රියාත්මක කරන ලදී. මෙම යෝජනා ක්‍රම අතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය වැඩසටහන, වහල මත සවි කරන සූර්ය බලශක්තිය ජනනය කිරීමේ වැඩසටහන සහ දේශීය අරමුදලින් ක්‍රියාත්මක කරනු ලැබූ "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ සහනදායී පොලී අනුපාත යටතේ ලබාදෙන ණය වැඩසටහන් 17 ක් ක්‍රියාත්මක කරන ලදී. එමඟින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පරිසරයට අයත් ගොවීන්, තරුණයන්, කාන්තා ව්‍යවසායිකාවන්, ස්වයං රැකියාවල නිරත වන්නන් සහ වෙනත් විශේෂ ඉලක්කගත කණ්ඩායම් ආවරණය වන පරිදි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා සාම්ප්‍රදායික නොවන ණය පහසුකම් හා මූල්‍ය නොවන තාක්ෂණික පහසුකම් සැපයීම සිදු කෙරිණි.

3. කෙසේ වෙතත්, මෙම යෝජනා ක්‍රම හඳුන්වාදීම පමණක් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හට සහය වීම සඳහා ප්‍රමාණවත් නැත. රට තුළ සංකීර්ණ බදු ප්‍රතිපත්ති, නම්‍යශීලී නොවන බැංකු නීති රීති හා රෙගුලාසි හේතුවෙන් බොහෝ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවූ අතර සමහර ව්‍යාපාර බුන්වත් විය. පවත්නා තත්ත්වය අවබෝධ කර ගැනීමෙන් පසුව නව රජය විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය නැවත පනගන්වමින් කාර්මික අංශය රටේ නව මං විවර කරන පුරෝගාමී අංශය බවට පත් කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුව වන "රට හදන සෞභාග්‍යයේ දැක්ම" යටතේ යෝජනා මාලාවක් සහිතව වැඩසටහනක් ප්‍රකාශයට පත් කර ඇත. මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම අරඹමින් රජය විසින් " බදු සහන පැකේජයක්" ක්‍රියාත්මක කළ අතර ව්‍යාපාර පරිසරය සක්‍රිය කිරීම සඳහා සරල බදු ප්‍රතිපත්තියක් ද හඳුන්වාදෙන ලදී. ව්‍යාපාර පරිසරය සක්‍රීය කිරීමෙන් පැනනැගුණ අවස්ථා පහසුවෙන් ළඟා කර ගැනීමට හැකි වන පරිදි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරිමත් කිරීමේ අපේක්ෂාවන් බැංකු වෙත ඔවුන්ගේ ඇති මූල්‍ය බැඳීම් වෙනුවෙන් සහනයක් ලබාදීම සඳහා "ණය සහන පැකේජය" හඳුන්වා දුන් අතර එය මෙම දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව එක්ව ක්‍රියාත්මක කරනු ලබයි.

4. 2019 වර්ෂයේ දී රජය විසින් කෘෂිකාර්මික අංශයේ විශාල වශයෙන් ආයෝජනය කළ අතර ගොවි ප්‍රජාවට උපරිම ප්‍රතිලාභ ලැබෙන අයුරින් පුළුල් කරන ලද විශාල කෘෂිකාර්මික සහය වැඩසටහන් වන රජයේ පොහොර සහනාධාර වැඩසටහන, ජාතික බෝග රක්ෂණ යෝජනා ක්‍රමය, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වී මිල දී ගැනීමේ වැඩසටහන සහ නවීන කෘෂිකාර්මික ගබඩා

පහසුකම් සැපයීමේ වැඩසටහන ආදිය අදාළ පාර්ශවයන් සමඟ සහයෝගයෙන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

5. නව රජයේ ආශිර්වාදය ඇතිව රජයේ විශාලතම සහනාධාර වැඩසටහන වන පොහොර සහනාධාර වැඩසටහන ගොවීන්ට වඩාත් හොඳින් ඵලදායී හා පැහැදිලි වන පරිදි පූර්වයෙන් තිබූ ක්‍රමවේදයට නැවත සකස් කරන ලදී. තවදුරටත් ගොවි ජනතාවට සැබෑ ප්‍රතිලාභ ලැබෙන පරිදි වී මිල දී ගැනීමේ වැඩසටහනෙහි හා බෝග රක්ෂණ යෝජනා ක්‍රමයේ නව්‍යකරණයන් සිදු කරන ලදී.

6. මෙම දෙපාර්තමේන්තුව විසින් ජනතාවගේ ජීවන වියදම පාලනය කිරීම සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස කටයුතු කළ අතර රටේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා විවිධාකර ක්‍රමවේද හඳුන්වාදෙන ලද අතර උපරිම සිල්ලර මිල, ආහාර වර්ගවල සුලභතාවය ඇති කිරීම සහ බදු ක්‍රමයේ වෙනස්කම් සිදු කිරීම ආදිය 2019 දී සිදු කරන ලදී. රජය විසින් ගන්නා ලද මෙම ක්‍රමවේදයන් අතර ආහාර වර්ගවල සුලභතාවය, වෙළඳපොළ තුළ කිසිදු හිඟයකින් තොරව ඇති කළ අතර සහල් සුලභතාවය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන ලදී.

7. තවද, මහා භාණ්ඩාගාරයේ අනෙකුත් දෙපාර්තමේන්තු හා සසඳන කළ මෙම දෙපාර්තමේන්තුවෙන් රජයේ ප්‍රධාන සහන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන බැවින් වාර්ෂිකව අයවැය ලේඛනයෙන් මුදල් අමාත්‍යාංශය වෙත වෙන්කරනු ලබන ප්‍රතිපාදනවලින් වැඩි ප්‍රමාණයක් මෙම දෙපාර්තමේන්තුව හරහා වියදම් වේ.

8. එම මූල්‍ය කටයුතු මෙහෙයවීමේ දී අනුමත කළ රජයේ මූල්‍ය නීති රීති හා කාර්යසාධන නියමයන් සඳහා වන ඉහළ අනුගතවීම් මෙන්ම මූල්‍ය පරිහරණයේ දක්ෂතාවය, විනිවිදභාවය, ක්‍රමාණුකූල බව මත පසුගිය වසර තුනක්ම රජ්‍ය ආයතනවල මූල්‍ය හා මෙහෙයුම් කාර්ය සාධනය සම්බන්ධ ඇගයීම් සම්බන්ධයෙන් පත්කළ රජයේ ගිණුම් කාරක සභාවේ විශිෂ්ඨ කාර්යසාධනය වෙනුවෙන් වූ ස්වර්ණ සම්මානයට පාත්‍ර විය.

සී අල්ගම
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්
භාණ්ඩාගාර ලේකම් වෙනුවට

ගීතා විමලවීර
අධ්‍යක්ෂ ජනරාල්

## 03 පරිච්ඡේදය - 2019 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ එෆ්

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

රු.

| අයවැය 2019 | | සටහන | තතය 2019 | 2018 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ -1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 4,933,544,993.69 | 2,045,579,007.62 | ඒසීඒ -3 |
| - | තැන්පතු | | 1,166,962.92 | 33,073,341.89 | ඒසීඒ -4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 5,231,299.42 | 1,968,609.92 | ඒසීඒ -5/ 5 (ඒ) /5 (බී) |
| - | වෙනත් ලැබීම් | | 3,751,112.53 | 22,753,226.64 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **4,943,694,368.56** | **2,103,374,186.07** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ මුළු ආදායම් නොවන ලැබීම් (අ) + (ආ)** | | **4,943,694,368.56** | **2,103,374,186.07** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | ඒසීඒ 2(ii) |
| 40,200,000.00 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 39,333,557.15 | 32,072,618.21 | |
| 13,460,000.00 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 11,715,829.13 | 9,100,317.99 | |
| 16,082,938,000.00 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 4,086,876,605.41 | 577,350,538.68 | |
| - | පොලී ගෙවීම් | 8 | - | | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| 16,136,598,000.00 | **මුළු පුනරාවර්තන වියදම් (ඇ)** | | **4,137,925,991.69** | **618,523,474.88** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **මූලධන වියදම්** | | | | |
| - | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | **10** | - | 234,211.25 | **ඒසීඒ - 2(ii)** |
| 103,400,000.00 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | **11** | 65,047,479.75 | 511,570,374.51 | |
| 2,110,202,000.00 | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | 1,305,649,880.71 | 1,572,685,278.68 | |
| 10,052,640,000.00 | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | 8,644,817,366.04 | 9,752,852,106.38 | |
| 2,160,000.00 | හැකියා වර්ධනය | **14** | 1,836,252.64 | 1,163,172.13 | |
| 209,900,000.00 | වෙනත් මූලධන වියදම් | **15** | 7,380,904.42 | 5,614,019.40 | |
| 12,478,302,000.00 | **මුළු මූලධන වියදම් (ඉ)** | | **10,024,731,883.56** | **11,844,119,162.35** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | 21,482,690.16 | 7,558,572.43 | |
| | **තැන්පතු ගෙවීම්** | | 17,121,089.76 | 2,100,149.23 | **ඒසීඒ -4** |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 4,361,600.40 | 5,458,423.20 | **ඒසීඒ -5/ 5 (ඒ) /5 (බී)** |
| | **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | | 14,184,140,565.41 | 12,470,201,209.66 | |
| - | **2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ - උ)** | | **(9,240,446,196.85)** | **(10,366,827,023.59)** | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ - පී

2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,706,109,588.80 | 1,635,641,050.90 |
| | | - | - |
| **මූල්‍ය වත්කම්** | | - | - |
| | | - | - |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/ 5(ඒ) | 7,718,268.63 | 8,587,967.65 |
| නොපියවූ අත්තිකාරම් | ඒසීඒ-3 | 212,059.09 | - |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **1,713,827,857.43** | **1,644,229,018.55** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | - | - |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | (8,645,978.66) | (23,730,406.48) |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5 (බී) | 1,706,109,588.80 | 1,635,641,050.90 |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 16,364,247.29 | 32,318,374.13 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **1,713,827,857.43** | **1,644,229,018.55** |

පිටු අංක 05 සිට 37 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 38 සිට 51 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි ම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහි දී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

..............................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : එස්.ආර්.ආටිගල

තනතුර : ලේකම්, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
දිනය: 24/2/2020

..............................
ගණන්දීමේ නිලධාරි
නම : .කේ.ජී.කේ.විමලවීර

තනතුර: අධ්‍යක්ෂ ජනරාල්
දිනය :2020/02/17

..............................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)

නම :ඩබ්.එල්.එම්.ඒ.ලියනගේ
දිනය :2020/02/12

ජී.කේ. විමලවීර
අධ්‍යක්ෂ ජනරාල්
සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල, කොළඹ 01.

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01

2

### 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**ජීසීජ් - සී**

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන 2019 රු. | 2018 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 4,370,106 | 2,068,332,234 |
| වෙනත් ශීර්ෂ වලින් එකතු කරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම | 4,932,926,000 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **4,937,296,106** | **2,068,332,234** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 51,015,906 | 49,024,152 |
| සහනාධාර සහ මාරුකිරීම් | 4,498,173,819 | 1,541,068,547 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 954,037 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 215,120,000 | - |
| ගෙවන ලද අත්තිකාරම් | 212,059 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **4,765,475,822** | **1,590,092,699** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)** | **171,820,284** | **478,239,535** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | 2,156,028 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **2,156,028** | **-** |

| | | |
|---|---|---|
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 156,052,670 | 507,806,857 |
| වෙනත් ආයෝජන | - | - |
| අත්තිකාරම් ගෙවීම් | 1,969,515 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **158,022,185** | **507,806,857** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)** | **(155,866,157)** | **(507,806,857)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **15,954,127** | **(29,567,321)** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 1,166,963 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **1,166,963** | **-** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම්වල වෙනස්වීම් | 17,121,090 | 29,567,321 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **17,121,090** | **29,567,321** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **(15,954,127)** | **(29,567,321)** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **(0)** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **(0)** | |

**3.4 මූල්‍ය ප්‍රකාශන සටහන්**

**වාර්තා කිරීමේ පදනම**

**1. වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**2. මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩි දියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩි දියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3. ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**4. දේපල, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැණීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්ම් විශවසනීයව මැණිය හැකි නම් එම වත්ම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

**6. මුදල් හා මුදල් සමාන දෑ**

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය.

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| අදාළ නොවේ | | | | | |

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය.

රු. 000

| ප්‍රතිපාදන වර්ග | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 16,.525,500.00 | 16,136,598.00 | 4,137,925.99 | 25.6% |
| ප්‍රාග්ධන | 11,389,400.00 | 12,478,302.00 | 10,024,731.88 | 80.33% |

3.7 මු. රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.

රු. 000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනවල %ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුදල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 1. | මුදල් අමාත්‍යාංශය | එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා 1625 දුරකථනය සඳහා වාර්ෂික ගාස්තු ගෙවීම් | 586.73 | 586.73 | 586.73 | 100% |
| 2. | ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | සංවර්ධන නිලධාරී වැටුප් ගෙවීම | 400.00 | 400.00 | 368.00 | 92% |

**3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය.**

රු. 000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය %ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | * 1,667,767.16 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 38,342.42 | 38,342.42 | | 100% |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්ක | | | | |

*අනුරාධපුර, මොණරාගල, මන්නාරම, රත්නපුර, කිලිනොච්චි, පොලොන්නරුව යන දිස්ත්‍රික්කවල ස්ථාපනය කර ඇති ධාන්‍ය සුරැකුම් මධ්‍යස්ථානවල භෞතික හිමිකාරත්වය අදාළ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත පවරා ඇත.

**3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව.**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TRE/B/DFD/02/19/19
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2020 ජූනි 02 දින

අධ්‍යක්ෂ ජනරාල්
සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

**සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව සහ විගණිත මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

එස්.එම්.ඩී.එස්. සුදීෂ් රෝහිත
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත :- 1) අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව -
(2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 9(ii) ඡේදය පරිදි සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්හි පිටපතක් හා උක්ත වාර්තාවේ පිටපතක් මේ සමඟ එවමි.)
2) ලේකම් - මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

මගේ අංකය / எனது இல. / My No. TRE/B/DFD/02/19/19 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2020 ජූනි 02 දින

ගණන්දීමේ නිලධාරී
සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

**සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

(අ) පුනරාවර්තන වියදම් සඳහා වූ වැය විෂයය 21 ක එකතුව රු. 15,988,107,000 ක් වූ ප්‍රතිපාදනවලින් එකතුව රු. 11,995,799,491 ක් වූ ප්‍රතිපාදන සියයට 28 සිට සියයට 99 දක්වා පරාසයකින් ඉතිරි කර තිබුණි. අක්මුදල් නොලැබීම හා සහනාධාර ගෙවීම් ඊළඟ වර්ෂයේ මුල් කාර්තුවේදී ගෙවීමට සිදුවීම නිසා මෙම ඉතිරිවීම් සිදුවී ඇතිබව අධ්‍යක්ෂ ජනරාල්වරයා විගණනයට දන්වා එවා තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 03 ක එකතුව රු. 15,000,000 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි කර තිබුණි.

(ඇ) මූලධන වියදම් සඳහා වූ වැය විෂයය 4 ක එකතුව රු. 1,727,490,000 ක් වූ ප්‍රතිපාදනවලින් එකතුව රු. 977,731,556 ක් හෙවත් සියයට 57 ක ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි. විදේශ ආධාර ව්‍යාපෘති මගින් අරමුදල් ලබාදීමේ ක්‍රියාවලියේ වෙනසක් සිදු කිරීම හේතුවෙන් එකී ප්‍රතිපාදන ඉතිරි වූ බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විගණනයට දන්වා එවා තිබුණි.

(ඈ) ජ්‍යෝෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා පොලී සහනාධාර වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු. 50,038,492,608 ක් වුවද, ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල බැරකම් දක්වා නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

එස්.එම්.ඩී.එස්.එස්. රෝහිත
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

**04 පරිච්ඡේදය - කාර්ය සාධක දර්ශක.**

**4.1 ආයතනයේ කාර්ය සාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව).**

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| ක්‍රියාත්මක කරන ලද ක්ෂුද්‍ර මුල්‍ය හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව ණය යෝජනා ක්‍රම | 100% | | |
| ආරම්භ කරන ලද නව ව්‍යවසායයන් | 90% | | |
| කාන්තා ව්‍යවසායන් සඳහා දෙනු ලැබූ ණය ප්‍රාමණ | 100% | | |

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය.

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්කය/අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%- 49% | 50%- 74% | 75% -100% |
| **අරුමුණු 01**<br>සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම | 1 ආ) දරිද්‍රතාව තුරන් කිරීමේ ක්‍රියාවලීන් සඳහා ආයෝජනය කිරීම වේගවත් කිරීමට, දරිද්‍රතාවෙන් පෙළෙන අය සඳහා ප්‍රමුඛත්වය ලබාදෙන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී ජාතික, කලාපීය සහ අන්තර් ජාතික මට්ටමේ ප්‍රතිපත්ති රාමු නිර්මාණය කිරීම. | 1.ආ.1) ප්‍රතිලාභ ලැබීම සම්බන්ධයෙන් අසාධාරණයට ලක්වන කාන්තාවන්, දිළිඳු පුද්ගලයින් සහ අවදානම් කණ්ඩායම් වැනි අංශ සඳහා වන රජයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය. | **ණය කපාහැරීමේ වැඩසටහන :**<br>ණයගැතියන් සංඛ්‍යාවඃ 45,139<br>ක්ෂුද්‍රමුල්‍ය සමාගම්/මුල්‍ය සමාගම් විසින් කපා හරින ලද ප්‍රාග්ධන මුදලඃ රු. මිලියන 1,255.74<br><br>ක්ෂුද්‍රමුල්‍ය සමාගම්/මුල්‍ය සමාගම් විසින් කපාහරින ලද පොලී මුදල : රු. මිලියන 141.41 | | |
| **අරමුණ 02**<br>සාගින්න නැති කර ආහාර සුරක්ෂිතභාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම. | 2.4) වසර 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානිකර කාළගුණ තත්ත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි | 2.4.3) ඵලදායි සහ තිරසාර කෘෂිකර්මය සිදුකරන කෘෂිකාර්මික භූමි ප්‍රමාණය. | **නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාවඃ 86,301<br>ණය මුදලඃ රු. මිලියන 10,370.19<br>වගා කරන ලද භූමි ප්‍රමාණය : (අක්කර) - 1,563,988<br><br>**"රන් අස්වැන්න" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 7,970<br>ණය මුදල : රු. මිලියන 11,469.3<br><br>**"ගොවි නවෝදා" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 1,451<br>ණය මුදල : රු. මිලියන - 682.4<br><br>**ධාන්‍ය ගබඩා ඉදිකිරීම**<br>අස්වැන්න බහුල කාලවල මිලෙහි ඇති වන පහත වැටීමෙන් ගොවීන්ට වන හානිය අවම කරමින් අස්වැන්න අඩු කාලවල දී ඉහළ මිලක් ලබා ගැනීමට අවස්ථාව ලබාදීමේ අරමුණින් වී, බඩඉරිඟු, සෝයා, තල, කව්පි, ගම්මිරිස්, රටකජු යනාදී ධාන්‍ය වර්ග ගබඩා කිරීම සඳහා | | |

| | | | |
|---|---|---|---|
| | කෘෂිකාර්මික භාවිතයන් ක්‍රියාවට නැංවීම. | | අනුරාධපුර, බුත්තල, මන්නාරම, කිලිනොච්චිය, පොලොන්නරුව සහ ඇඹිලිපිටිය යන ප්‍රදේශවල ගබඩා 06 ක් ඉදි කිරීම.<br><br>**වී සහල් බවට පත් කිරීමේ වැඩසටහන**<br>2019 වර්ෂයේ නොවැම්බර් මස වන විට ඇති වූ සහල් හිඟය හා සහල් මිල ඉහළයාම, නිසා අති වූ මිල ඉහළ යාම පාලනය කිරීම සඳහා සහල් මෙ. ටො. 26,000 ක් පමණ සතොස හා සුපිරි වෙළඳසැල් හරහා අලෙවි කිරීමෙන් මිල පහළ යන ලදී. |
| **අරමුණ 04**<br>පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම. | 4.2) වසර 2030 වන විට සියලුම ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට, සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවුරු කිරීම. | 4.2.1) ස්ත්‍රී පුරුෂ භාවය අනුව සෞඛ්‍යමය, ඉගෙනුම් සහ මනෝවිද්‍යාත්මක අංශයන්ගෙන් යහපත් සංවර්ධන මාර්ගයකට අවතීර්ණව සිටින වයස අවු. 5 ට අඩු ළමුන්ගේ ප්‍රමාණය | **"සිගිති පාසල" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 62<br>ණය මුදල : රු. මිලියන් 63.4<br><br>**"රැකවරන" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 9<br>ණය මුදල : රු. මිලියන - 44.4 |
| | 4.7) වසර 2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වු දැනුම සහ කුසලතාවන් ලබාගෙන සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරිසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් | 4.7.1) ගෝලීය පුරවැසිභාවය පිළිබඳ ඉගෙනුම II. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සහ මානව හිමිකම් (අ) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් (ආ) විෂය මාලාවන් (ඇ) ගුරු අධ්‍යාපනය සහ (ඈ) ශිෂ්‍ය ඇගයීම් යන සියළු මට්ටම්වල දී ප්‍රවාහානුගතව පැවතීම ඇතුළත් තිරසර සංවර්ධනය සඳහා වන ඉගෙනුම. | **"මගේ අනාගතය" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 729<br>ණය මුදල : රු. මිලියන - 650.5<br><br>**"ඇරඹුම" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 175<br>ණය මුදල : රු. මිලියන - 230.99 |

| | | | |
|---|---|---|---|
| | තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායක වීම ඇතුලත් වේ. | | |
| **අරමුණ 5**<br>ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම. | 5.1) කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලු ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම. | 5.1.1) ස්ත්‍රී පුරුෂ භාවයට අදාළව සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම් ප්‍රවර්ධනය බලාත්මක කිරීම සහ අධීක්ෂණය පිණිස වන නෛතික රාමුවක් පවත්නේද නැද්ද යන්න. | **කාන්තා ව්‍යවසායකත්ව මූල්‍ය ආධාර ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 313<br>ණය මුදල : රු. මිලියන් 613.6 |
| **අරමුණ 7**<br>සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම. | 7. ආ) වසර 2030 වන විට විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල කුඩා දිවයින් රාජ්‍යයන්හි සහ අනෙකුත් රටවල දේශ සීමාවන්ගෙන් ආවරණය වූ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ද ඇතුලත්ව සියලුම සංවර්ධනය වන රටවල ඔවුන්ගේ වැඩසටහන් සැලසුම් වලට අනුකූලව නවීන සහ තිරසර බලශක්ති සේවා සැපයීම සඳහා යටතල පහසුකම් ව්‍යාප්ත කිරීම සහ තාක්ෂණය වැඩි දියුණු කරීම. | 7. ආ 1) දළ දේශීය නිෂ්පාදනයේ සහ තිරසර සංවර්ධන සේවා සඳහා වන යටිතල පහසුකම් සහ තාක්ෂණය පිණිස වන මූල්‍ය හුවමාරුව පිණිස වන ඍජු විදේශ ආයෝජන ප්‍රමාණයට අනුපාතව බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා වන ආයෝජන. | **"රිවි බල සවිය" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 453<br>ණය මුදල : රු. මිලියන 157.6<br><br>**වහලය මත සවි කරන ලද සූර්ය බලශක්ති උත්පාදන ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 1,020<br>ණය මුදල : රු. මිලියන 1,749.8 |

| | | | |
|---|---|---|---|
| **අරමුණ 8**<br>සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම. | 8.3) ඵලදායී ක්‍රියාකාරකම්වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලී භාවයට සහය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තියෙන් ප්‍රවර්ධනය කිරීම මූල්‍ය සේවාවන්ට ප්‍රවේශවීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර, කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම් සහ සංවර්ධනය කිරීම් දිරි ගැන්වීම. | 8.3.1) ස්ත්‍රී පුරුෂ භාවය අනුව, කෘෂිකාර්මික නොවන සේවා නියුක්තියේ නොවිධිමත් සේවා නියුක්ති ප්‍රමාණය. | **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 1,011<br>ණය මුදල : රු. මිලියන 6,807<br><br>**"ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 1,000<br>ණය මුදල : රු. මිලියන 21,357.4<br><br>**"හරිත ණය" යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 242<br>ණය මුදල : රු. මිලියන - 791.5<br><br>**"දිරි සවිය" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 572<br>ණය මුදල : රු. මිලියන 4,13.3<br>**"රිය ශක්ති" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 178<br>ණය මුදල : රු. මිලියන 613.8<br><br>**"මාධ්‍ය අරුණ" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 258<br>ණය මුදල : රු. මිලියන 76.9<br><br>**"සංචාරක පොඩ්ඩෝ" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 1,198<br>ණය මුදල : රු. මිලියන 538.46<br><br>**"සිටි රයිඩ්" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 8<br>ණය මුදල : රු. මිලියන 52.1 |
| | 8.5) වසර 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුලත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම. | 8.5.1) රැකියාව, වයස සහ ආබාධිත සහිත පුද්ගලයන් යන සාධක අනුව පිරිමි සහ ගැහැණු සේවා නියුක්තිකයන්ගේ පැයක සාමාන්‍ය ආදායම් ඉපයීම. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 6 ක් සම්බන්ධ වෙමින් එක් සමාගමක් පිහිටුවන ලදී. |
| | 8.9) 2030 වන විට දේශීය සංස්කෘතිය, නිෂ්පාදනය හා රැකියා වස්ථාවන් | 8.9.2) සංචාරක ක්ෂේත්‍රයේ සමස්ත රැකියා ප්‍රමාණයෙන් තිරසර සංචාරක | **"ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය :**<br>රැකියා 8,204 |

| | | | |
|---|---|---|---|
| | ප්‍රවර්ධනය කරන්නා වූ තිරසර සංවර්ධන කර්මාන්ත පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. | කර්මාන්ත ක්ෂේත්‍රයේ රැකියා ප්‍රමාණය. | **"සංචාරක සත්කාර නිවාස" ණය යෝජනා ක්‍රමය** : රැකියා 242<br><br>**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය :** රැකියා 1,011<br><br>**"සංචාරක පොඩ්ඩෝ" ණය යෝජනා ක්‍රමය** : රැකියා 1,198 |
| **අරමුණ 11**<br>නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | 11.1) 2030 වන විට සියලුම දෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිලට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩි දියුණු කිරීම. | 11.1.1) පැල්පත්, අවිධිමත් ජනාවාස හෝ ප්‍රමාණවත් නොවන නිවාස පහසුකම් යටතේ ජීවත් වන නාගරික ජනගහනයේ ප්‍රමාණය. | **"සොඳුරු පියස" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 14,834<br>ණය මුදල රු. මිලියන : 2,958.3<br><br>**"හෝම් ස්වීට් හෝම්" ණය යෝජනා ක්‍රමය :**<br>ණය සංඛ්‍යාව: 1,282<br>ණය මුදල රු. මිලියන : 4,585.2<br><br>**"සිහින මාලිගා" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 247<br>ණය මුදල රු. මිලියන : 1,332.5 |

**5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න**

ශ්‍රී ලංකා රජයේ සමස්ත ප්‍රතිපත්ති රාමුව තුළ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන් රටේ සංවර්ධන ක්‍රියාවලියන් සඳහා වැදගත් උපායමාර්ගික අංශයන් ලෙස හඳුනාගෙන ඇත. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය හා ක්ෂුද්‍රමූල්‍ය අංශය නගා සිටුවීම සඳහා අවශ්‍ය රාජ්‍ය යාන්ත්‍රනයේ දායකත්වය ලබාදීමේ අරමුණ පෙරදැරිකර ගනිමින් මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. ආර්ථික සංවර්ධනය, ප්‍රාදේශීය සංවර්ධනය, රැකියා අවස්ථා උත්පාදනය හා දරිද්‍රතාවය තුරන් කිරීමට විශාල දායකත්වයක් ලබා දෙන වැඩසටහන් රාශියක් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් පසුගිය වසරේ ක්‍රියාවට නංවන ලදී. ඒ අනුව, නියඟයෙන් පීඩාවට පත් දිස්ත්‍රික්කවල ක්ෂුද්‍රමූල්‍ය ණය කපා හැරීම, පොළී සහනාධාර ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම, වී මිල දී ගැනීමේ වැඩසටහන, පොහොර සහනාධාර වැඩසටහන, ගොවි විශ්‍රාම වැටුප් හා වගා රක්ෂණ යෝජනා ක්‍රමය, කාන්තා ව්‍යවසායකත්ව මූල්‍ය ආධාර ණය යෝජනා ක්‍රමය, ධාන්‍ය ගබඩා ඉදිකිරීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය මෙන්ම සූර්ය බලශක්ති උත්පාදන ණය යෝජනා ක්‍රමය යනාදී ආර්ථිකයට ඵලදායී දායකත්වයක් ලබාදුන් කාර්යයන් රාශියක් සඳහා මැදිහත් වන ලදී.

ආකර්ශනීය කොන්දේසි හා පහසුවෙන් ලබාගත හැකි වීම යන කරුණු නිසා ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව තම මූල්‍ය අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා මූල්‍ය සමාගම් හා ක්ෂුද්‍රමූල්‍ය ආයතන වෙත යොමු වීම සුලභ කරුණක් වී ඇත. එම ණය සඳහා අයකරනු ලබන ඉහළ පොලී අනුපාතය හා අදාළ ණය මුදල ඵලදායී ආර්ථික කටයුතුවල ආයෝජනය නොකිරීම නිසා මෙම ප්‍රදේශවල කාන්තාවන් හා ඔවුන්ගේ කුටුම්භයන් දැඩි මූල්‍ය දුෂ්කරතාවයන්ට මුහුණ දීමේ ප්‍රතිඵලයක් ලෙස ලබාගත් ණය ගෙවීම සඳහා නැවත ණය ලබාගැනීම හේතුවෙන් ණය උගුලක හසුවීමෙන් ඔවුන් දැඩි ආර්ථික පසුබෑමකට ලක් වී ඇත. ඒ අනුව, පසුගිය කාලවල නියඟයෙන් පීඩාවට පත් වූ ත්‍රිකුණාමලය, අම්පාර, මඩකලපුව, යාපනය, මුලතිව්, කිලිනොච්චි, වව්නියාව, මන්නාරම, කුරුණෑගල, පුත්තලම,

අනුරාධපුරය, පොලොන්නරුව යන දිස්ත්‍රික්කවල පදිංචි කාන්තාවන් විසින් ශ්‍රී ලංකා මහ බංකුවේ ලියාපදිංචි මූල්‍ය සමාගම් හා ක්ෂුද්‍රමූල්‍ය වෘත්තිකයිනගේ සංගමයේ ලියාපදිංචි ක්ෂුද්‍රමූල්‍ය ආයතනවලින් ලබාගත් ක්ෂුද්‍රමූල්‍ය ණය කපාහරින ලදී. එහිදී, උපරිමය රු. 100,000 ක් වූ ක්ෂුද්‍රමූල්‍ය ණය මුදල් හි 2018 ජුනි 30 දින වන විට අවම වශයෙන් අඛණ්ඩව මාස 03 ක් හිඟව ඇති ණය මුදල් ශේෂයන් හා හිඟ පොලී ප්‍රමාණය පිළිවෙලින් රු. මිලියන 1,255 ක් හා රු. මිලියන 141 ක් කපා හරින ලද අතර එමඟින් ණය ලාභීන් 45,139 කට ප්‍රතිලාභ හිමි විය. මහා භාණ්ඩාගාරය විසින් ණය කපා හැරීම සඳහා යන පිරිවැය දරණ ලදී. වාරික හයකින් ගෙවිය යුතු වූ මෙහි පළමු හා දෙවන වාරිකය ලෙස රු. මිලියන 420 ක් 2019 වසර තුළ දී අදාළ ආයතනවලට ගෙවන ලදී. මෙම වැඩසටහන නිසා නියඟයෙන් පීඩාවට පත් ජනතාව සඳහා යම් සහනයක් හිමි වූ අතර තවදුරටත් ජනතාව පීඩාවට පත්කරමින් එක් එක් ආයතනයේ කැමත්ත අනුව වෙනස් කිරීමට නොහැකි වන ලෙස මූල්‍ය ව්‍යාපාර පනත, මූල්‍ය කල්බදු පනත හා ක්ෂුද්‍රමූල්‍ය පනත යන පනත්වලට අනුව යමින් මූල්‍ය සමාගම් හා ක්ෂුද්‍රමූල්‍ය ආයතන විසින් සපයනු ලබන සියලුම ක්ෂුද්‍රමූල්‍ය ණය සඳහා අය කළ හැකි උපරිම වාර්ෂික පොලී අනුපාතය (සඵල පොලී අනුපාතය) සියයට 35 ක් ලෙස නියම කරමින් ඊට අදාළ මාර්ගෝපදේශ ශ්‍රී ලංකා මහ බංකුව හරහා නිකුත් කරන ලදී.

ආහාර සුරක්ෂිතභාවය, යහපත් පෝෂණ මට්ටමක්, තිරසර කෘෂිකාර්මික සංවර්ධනය ලඟාකර ගැනීමේ අරමුණකින් වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. එම වැඩසටහන් අතර පොහොර සහනාධාර වැඩසටන, වී මිල දී ගැනීමේ වැඩසටහන, ධාන්‍ය ගබඩා ඉදි කිරීම, පොලී සහනාධාර කෘෂි ණය, වගා රක්ෂණ යනාදිය මඟින්, ගොවියා මෙන්ම පාරිභෝගිකයා ද ආරක්ෂා කරමින් තුළිත වෙළඳපොලක් පවත්වාගෙන යාමට අවශ්‍ය දායකත්වය ලබා දෙන ලදී.

කෘෂිකාර්මික ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් රාශියක් අතරින් පොහොර සහනාධාර වැඩසටහන සුවිශේෂී ස්ථානයක් ගනු ලබන්නේ එමඟින් ගොවීන්ගේ නිෂ්පාදන පිරිවැය අවම මට්ටමක පවත්වා ගැනීමට හැකි වන බැවිනි. එමඟින් ගොවීන්ට පොහොර මිල අධික වීම නිසා මුහුණ පෑමට සිදුවන අවහිරතා මගහරවා ගැනීමට හැකියාව ලැබිණි. 2020 වසරේ සිට පරිසර හිතකාමී හා සමාජ හිතකාමී කෘෂිකාර්මික යෙදවුම් හා භාවිතයන් හඳුන්වාදෙමින් අහිතකර රසායනික ද්‍රව්‍යයන් අඩංගු නොවන සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් පරිභෝජනය සඳහා ඉඩ ප්‍රස්ථා පුළුල් කරමින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික භාවිතයන් ක්‍රමානුකූලව කාබනික පොහොර භාවිතය සඳහා යොමු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග රජය විසින් ගෙන තිබේ. මෙම නව ක්‍රමය යටතේ අකාබනික හා කාබනික පොහොර ගොවීන් වෙත නොමිලේ ලබාදීමට කටයුතු කරනු ලබන අතර, ක්‍රමානුකූලව ගොවියා කාබනික පොහොර භාවිතය කෙරෙහි නැඹුරු කරවීමටත් රසායනික පොහොර භාවිතයෙන් බැහැර කරවීමටත් අපේක්ෂා කෙරේ.

සහල් රටෙහි ප්‍රධාන ආහාරය වන අතර ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණ තත්ත්වය සහතික කිරීමේ ප්‍රධාන සාධකය ද වේ. ඒ අනුව, ගොවීන්ගේ අස්වනු සඳහා සාධාරන මිලක් ලබාදීම සඳහා මෙන්ම සහල් මිල ස්ථාවරව පවත්වා ගැනිමෙන් පාරිභෝගිකයා ද ආරක්ෂා කර ගැනීමේ අරමුණින්, 2019 වසරේ ද රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරු විසින් 2019 වසර තුළ මහා භාණ්ඩාගාර අරමුදල් රු. මිලියන 1,886 ක පමණ වියදම් කරමින් වී මෙ.ටො. 48,271 ක පමණ ප්‍රමාණයක් මිල දී ගන්නා ලදී.

අස්වනු නෙලන කාලයේ දී ගොවීන්ගේ කෘෂි බෝගවල සුරක්ෂිතතාවය රැකගනිමින් අතරමැදි වෙළෙන්දන් විසින් කෘෂි අස්වනු අඩු මිලට මිල දී ගැනීම වලක්වාලමින් ගොවීන්ගේ ආදායම් ඉහළ දැමීම සඳහා රජයේ කළමනාකාරීත්වයෙන් ගබඩා සංකීර්ණ 6 ක් ස්ථාපිත කර ඇත. අනුරාධපුර,

මොණරාගල, මන්නාරම, රත්නපුරය, කිලිනොච්චිය හා පොලොන්නරුව යන දිස්ත්‍රික්කවල මෙම ගබඩා ස්ථාපනය කර ඇත. මෙම ගබඩා සංකීර්ණවල බෝග වියළීම, පිරිසිදු කිරීම, රසායනාගාර තුළ බීජ පරීක්ෂා කිරීම හා නූතන තාක්ෂණයට අදාළ ලෙස ගබඩා කිරීම කළ හැක. මේ ආකාරයට තම කෘෂි අස්වනු මෙම ගබඩා තුළ තබා වෙළඳපොළ මිල ඉහළ ගිය පසු අලෙවි කිරීම මඟින් ගොවීන්ට ඉහළ ආදායමක් ලබා ගත හක. මෙම ගබඩා සංකීර්ණයන්හි වී, බඩඉරිඟු, සෝයා බෝංචි, තල, උඳු, ගම්මිරිස් හා රටකජු යන බෝග වර්ග ගබඩා කර තැබිය හැකි අතර ආසන්න වශයෙන් මෙ.ටො. 48,000 ක ගබඩාගත ධාරිතාවයක් ඇත. මෙම ධාන්‍ය ගබඩා ස්ථාපිත කිරීමෙන් පසු මේ වන තෙක් ගොවීන් විසින් රු. මිලියන 68.7 ක් පමණ වර්ධක ආදායමක් උපයා ඇත.

සැමට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණු කරගනිමින් පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම රාශියක් ක්‍රියාත්මක කරන ලදී. සිගිති පාසල, රැකවරණ හා මගේ අනාගතය යන පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම යටතේ ක්‍රියාත්මක විය. ඒ අනුව ස්ත්‍රී පුරුෂභාවයෙන් තොරව සැමට ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා උසස් අධ්‍යාපනයට අවශ්‍ය මූල්‍ය පහසුකම් අහිමි දරු දැරියන් රැසකට ඒ සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයන ලදී. එසේ උසස් අධ්‍යාපනය ලබා ගැනීමෙන් පසු රජයේ රැකියාවක් මත රැඳීම වෙනුවට ස්වශක්තියෙන් නැගී සිටින තරුණ ව්‍යවසායකයින් බිහි කිරීම සඳහා අවශ්‍ය ණය පහසුකම් ඇරඹුම ණය යෝජනා ක්‍රමය මඟින් ලබා දෙන ලදී. ඒ අනුව, 2019 වසර අවසන් වන විට මෙම ණය යෝජනා ක්‍රම යටතේ ණය ලාභීන් 975 දෙනෙක් අතර රු. මිලියන 989 ක් ලබා දී ඇත.

කාත්නා ව්‍යවසායකයින් සවිබල ගැන්වීමේ අරමුණින් "කාන්තා ව්‍යවසායකත්ව මූල්‍ය ආධාර යෝජනා ක්‍රමය", සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය (SMELoC) යටතේ හඳුන්වාදෙන ලදී. රටේ සමස්ත ශ්‍රම බලකායේ ඉහළ යෑමට සමගාමීව, පෙර වසරට සාපේක්ෂව 2019 වසරේ දී ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය ඉහළ ගිය ද, ශ්‍රී ලංකාව තවදුරටත් ලොව පුරා වැඩිම ස්ත්‍රී පුරුෂ ශ්‍රම බලකා සහභාගීත්ව පරතරයක් ඇති රටවල් 20 අතර රැඳී සිටී. එබැවින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය යටතේ කාන්තා ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා ඔවුන් තම ව්‍යාපාර ආරම්භ කිරීම හා දියුණු කිරීම වෙනුවෙන් ලබා ගන්නා ණය මුදලින් 20% ක මුදලක් නැවත නොගෙවිය යුතු ප්‍රදානයක් ලෙස ලබා දෙන ලදී. ඌන සංවර්ධිත ප්‍රදේශ වන උතුරු, නැගෙනහිර, ඌව හා සබරගමුව යන දිස්ත්‍රික්කවල කාන්තා ව්‍යවසායකයින් විසින් ලබා ගන්නා ණය මුදල් සඳහා වන මෙම ප්‍රදානය 25% කි. ආසියානු සංවර්ධන බැංකු පුහුණුව ලද ව්‍යවසායකයින් සඳහා 30% ණය ප්‍රදානයක් හා ආසියානු සංවර්ධන බැංකු පුහුණුව ලැබූ ඌන සංවර්ධිත ප්‍රදේශවල කාන්තා ව්‍යවසායකයින් සඳහා වන ණය ප්‍රදාන ප්‍රතිශතය 35%කි. ඒ අනුව 2019 වසර අවසන් වන විට මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභීන් 313 දෙනෙකු අතරේ රු. මිලියන 613 ක් ලබා දී ඇත.

ගෝලීය බලශක්ති පරිභෝජන ප්‍රවණතාවයට අනුව, පොසිල ඉන්ධන වෙනුවට අඩු වියදම් හා පරිසර හිතකාමී පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් භාවිත කිරීම දිරිගැන්වීම සඳහා රිවි බල සවි ණය යෝජනා ක්‍රමය හා ගොඩනැගිලි මත සවි කරන සූර්ය බල පද්ධති මඟින් සූර්ය බලශක්ති උත්පාදනය කිරීමේ ණය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. එමගින්, හැකි සෑම නේවාසික හා වාණිජ ගොඩනැගිලිවල වහල මත සූර්ය බලශක්ති උත්පාදන පද්ධති ස්ථාපිත කිරීම තුළින් වසර 2020 වන විට මෙගා වොට් 200 ක් හා වසර 2025 වන විට මෙගා වොට් 1,000 ක් ජාතික විදුලිබල සැපයුමට එක් කිරීම බලාපොරොත්තු වේ. මෙම ණය යෝජනා ක්‍රම දෙක යටතේ ප්‍රතිලාභීන් 1,473 දෙනෙක් වෙනුවෙන් රු. මිලියන 1,906 ක ණය සපයා ඇත.

ඒ අනුව, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් බොහොමයක් ජනතාවගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් වේ. රට තුළ පැවති සංකීර්ණ බදු ප්‍රතිපත්ති, නම්‍යශීලී නොවන බැංකු නීති රීති හා රෙගුලාසි, බැංකු කරුවන් විසින් තම සාම්ප්‍රදායික ණය හිමියන් සඳහා ණය ලබාදීමට දක්වන වැඩි කැමැත්ත, රජය විසින් හඳුන්වාදෙන පහසුකම් පිළිබඳව ජනතාව විධිමත් ලෙස දැනුවත් නොවීම හා ජනතාව නම්‍ය ශීලී ලෙස වෙනස් වීමට දක්වන අකමැත්ත යන බාධා අවම කර ගැනීම තුළින් මෙම වැඩසටහන්වල උපරිම ප්‍රතිලාභ මහජනතාවට ලබා දිය හැක.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ.

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය.

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/(අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෂ්ඨ | 19 | 18 | 01 |
| තෘතීයික | 15 | 15 | 0 |
| ද්විතීයික | 0 | 0 | 0 |
| ප්‍රාථමික | 12 | 12 | 0 |

6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ඇබෑර්තුවක් පවතින තනතුරෙහි රාජකාරි ආවරණ කටයුතු අනෙකුත් නිලධාරීන් විසින් සිදු කරනු ලබයි.

6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ව්‍යාපෘති සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ 5 වන සමුළුව. | 1 | දින 3 | 86.3 | | විදේශීය | ආසියානු සංවර්ධන බැංකු විසින් නව ව්‍යාපෘති ක්‍රමවේදයක් පිළිබඳව දැනුම ලබාගත් අතර අනෙක් රටවල දැනුම ද බෙදා ගන්නා ලදී. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| G 20 නායකත්ව සමුළුව | 1 | දින 2 | 50.4 | | විදේශීය | ආර්ථික කටයුතු සඳහා කාන්තා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමේ සහ විවිධ රටවල අත්දැකීම් හුවමාරු කර ගැනීමේ නව මුලපිරීම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා තරුණ ජාත්‍යන්තර නායකයින් සහභාගී වූ ඉහළ මට්ටමේ ජාත්‍යන්තර සංසඳයකි. |
| 3 වන ආසියානු මූල්‍ය සමුළුව. | 1 | දින 2 | 109.6 | | විදේශීය | මූල්‍ය සේවාවලට අදාළ මාතෘකා පිළිබඳ තීක්ෂණ බුද්ධිය සහ දැනුම, විකල්ප ණය ලකුණු කිරීම, මහ බැංකු ඩිජිටල් මුදල් සහ සයිබර් ආරක්ෂාව වැනි තාක්ෂණික භාවිත කිරීම් පිළිබඳ දැනුම ලබා ගන්නා ලදී. |
| ප්‍රජා මූලික ක්ෂුද්‍ර ණය හා ප්‍රමාණවත් ආර්ථික සංවර්ධනය. | 1 | දින 13 | 113.4 | | විදේශීය | පුහුණුවට සම්බන්ධවූ රටවල් අතර තායිලන්තයේ ක්ෂුද්‍ර ණය හා ප්‍රමාණවත් ආර්ථික සංවර්ධනය පිළිබඳව දැනුම හුවමාරු කර ගැනීමට අවස්ථාව උදාවිය. |
| රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව | 2 | දින 11 | 1,851 | | විදේශීය | DIPPCA පාඨමාලාවට අදාළව එක්සත් රාජධානියේ විදෙස් පුහුණුව සම්පූර්ණ කිරීම මඟින් සංකීර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලීන් හා භාවිතයන් පිළිබඳ දැනුම වර්ධනය විය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සමූපකාර ක්ෂුද්‍ර ණය | 1 | දින 11 | 80.04 | | විදේශීය | මලේසියාවේ සමූපකාර ක්ෂුද්‍රමූල්‍ය ප්‍රතිපත්තීන් ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍රමූල්‍ය ක්ෂේත්‍රය නගාසිටුවීම සඳහා ඵලදායීව යොදා ගැනීම සම්බන්ධයෙන් දැනුම වඩා වර්ධනය කිරීම. |
| රියදුරන් සඳහා විනය හා කාර්යාලීය ආධාර විධි | 2 | දින 2 | 17.00 | | දේශීය | සදාචාරාත්මක හා විනයානුකූලව නිලධාරියෙකු සමඟ කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුම රියදුරන් ලබාගෙන ඇත. |
| MS-Excel පිළිබඳ ඉහළ කුසලතා | 3 | දින 2 | නොමිලේ පවත්වන ලදී. | | දේශීය | ගිණුම් කටයුතු සම්බන්ධයෙන් මූලික තොරතුරු එක් පැතුම්පතක් තුළ තබා ගන්නේ කෙසේද, එමගින් තොරතුරු ඉක්මණින් ලබා ගැනීමට සහ අවශ්‍ය විටක අවශ්‍ය ආකාරයට ඒවා සකස් කර ගැනීම, ගිණුම් සාරාංශගත කිරීම සහ මුදල් පුරෝකතනය කිරීම සම්බන්ධයෙන් දැනුම ලබා ගන්නා ලදී. |
| රාජ්‍ය සේවයේ වැටුප් පරිවර්තනය | 2 | දින 2 | 37.50 | | දේශීය | වැටුප් පරිවර්තන චක්‍රලේඛ අධ්‍යයනය කිරීමට නිලධාරීන්ට විශේෂ අවස්ථාවක් තිබූ අතර එය දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ හිඟ වැටුප් සකස් කිරීමේ දී උපකාරී විය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන් | 1 | දින 2 | | | දේශීය | වර්තමාන ප්‍රසම්පාදන පටිපාටි සහ රීති එදිනෙදා රාජකාරී කටයුතුවල දී භාවිත කරන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුම ලබා ගන්නා ලදී. |
| විධිමත් ලිපි ලිවීමේ පුහුණු වැඩසටහන. | 1 | දින 1 | නොමිලේ පවත්වන ලදී. | | දේශීය | විධිමත් ලිපියක් නිසි ලෙස ලිවීමට එම පුහුණු වැඩසටහන වඩාත් ප්‍රයෝජනවත් විය. |

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1.** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.6 | වෙනත් | අනුකූල වේ | | |
| **2.** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු. රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛණ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3.** | **මූල්‍ය පාලනය සඳහා කා්රයයන් අභිනියෝජනය කිරීම (මු. රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය ගණකාධිකාරීවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම, | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **4.** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5.** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල වේ | | |
| **6.** | **අභ්‍යන්තර විගණන** | | | |
| 6.1 | මු. රෙ. 134(2) DMA/1 -2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **7.** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛන 1-2019 අනුව, අවම වශයෙන් විගණන කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | අනුකූල වේ | | |
| **8.** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ජේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම, | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ජේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විදාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම. | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනයට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛනයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු. රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ | | |
| **9.** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අදාළ නොවේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු. රේ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් වන විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු, වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| **10.** | **ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| **11.** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | | |
| 11.2 | මු. රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ | | |
| **12.** | **රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| **13.** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු. රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **14.** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | | |
| 14.2 | මු. රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.3 | මු. රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුම් ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| **15.** | **ආදායම් ගිණුම්** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම. | අනුකූල වේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | | |
| 15.3 | මු. රෙ. 176 හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **16.** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සිමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති DMA චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම. | | | |
| **17.** | **මහජනයා වෙත තොරතුරු ලබාදීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනතාවගේ ප්‍රසංශා/චෝදනා පල කිරීමට පහසුකම් සලකා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **18.** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/20/18 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **19.** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබිම. | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ජේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| **20.** | **විගණන ජේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ජේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | | |